රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ:27/2001

මගේ අංකය : II/309 ඊ95/22
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,
පළාත් පාලන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2001.10.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් ස්ථිර කිරීම

රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සියළුම සේවකයින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන්නේ නම් 2001 ඔක්තෝබර් මස 01 වන දින සිට සේවයේ ස්ථිර කළ යුතුයැයි රජය තීරණය කර ඇත.

I. 2001 ඔක්තෝබර් 01 දිනට දින 180 කට නොඅඩු අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

II. අනුමත බඳවාගැනීම් පරිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

III. අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු තිබිය යුතුය.

02. මේ යටතේ ස්ථිර කිරීමට සුදුසුකම් ලබන සේවකයින්ගේ වයස 2001.10.01 දිනට අවුරුදු 45 ඉක්මවා තිබුනද ඔවුන් ආදේශක, අනියම්, තාවකාලික හා කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා අවස්ථාවේදී වයස අවුරුදු 45 ඉක්මවා නොතිබුනේ නම්, ඔවුන් සේවයේ ස්ථිර කළ හැකිය.

03. ඉහත තීරණය අනුව කටයුතු කිරීමට නොපමාව පියවර ගනුමැනවි.

04. මෙම කරුණට අදාලව නිකුත් කර ඇති අංක 26/2001 සහ 2001.10.19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අවලංගු කරනු ලැබේ.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනුයේ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිවය.

**යූ.පී.ජයසිංහ**
**වැඩබලන ලේකම්**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා,**
**පළාත් පාලන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය**